# PROVISIONS, CONTINGENT LIABILITIES

# &

# CONTINGENT ASSETS

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# <u>ප්‍රමිතියට අදාළ නිර්වචන</u>

1. **ප්‍රතිපාදන** :

කාලය හෝ ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවක් සහිත වගකීමකි.

2. **අසම්භාව්‍ය වගකීම් :**

''අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ජනිත වූ ආයතනයේ සම්පූර්ණ පාලනයෙන් තොර අනාගත සිදුවීම් එකක් හෝ කීපයක සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් ඒවායෙහි පැවැත්ම තහවුරු විය හැකි බැඳීමක් ''අසම්භාව්‍ය වගකීමක් වේ.

තව ද, අතීත සිදු වීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති වුව ද, පහත සඳහන් හේතු නිසා වගකීමක් ලෙස හඳුනා ගෙන නැති වර්තමාන බැඳීම් අසම්භාව්‍ය වගකීම් වේ.

ClassWork.LK

- එම බැඳීම පියවීම ආර්ථික ප්‍රතිලාභ ජනනය කළ හැකි සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලායෑමේ භව්‍යතාවක් නැති හෝ
- බැඳීමේ වටිනාකම විශ්වාසදායි ලෙස මැනිය නොහැකි නිසා හඳුනා නොගන්නා වර්තමාන බැඳීමක් වීම.

## 3. **අසම්භව්‍ය වත්කම් :**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් සේ ඇති වන, ව්‍යාපාරයේ පාලනයෙන් තොර අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීමක් හෝ නොවීම මත පැවැත්ම තහවුරු කරන වත්කමකි.

ClassWork.LK

# <u>ප්‍රතිපාදන හා අසම්භාව්‍ය වගකීම් වෙන් කර හඳුනා ගැනීම</u>

## ප්‍රතිපාදන :

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් හඳුනා ගනු ලැබීමට නම් පහත කොන්දේසි ඉටු විය යුතු ය.

- ඒකකයට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් පැවතීම.
- එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යෑමේ හව්‍යතාවක් තිබීම.
- බැඳීමට අදාළ වටිනාකම පිළිබඳ විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිවීම.

ඉහත කොන්දේසි සපුරාලන්නේ නම් අදාළ බැඳීම ඇස්තමේන්තු කොට එම අගය ආදායම් ප්‍රකාශනය තුළ වියදමක් ලෙසත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වගකීමක් ලෙසත් හඳුනා ගැනේ.

ClassWork.LK

## අසම්භව්‍ය වගකීම් :

අසම්භව්‍ය වගකීමක් හඳුනා ගැනීමට නම් පහත සඳහන් කොන්දේසි ඉටු විය යුතු ය.

1. බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යෑමේ භව්‍යතාවක් නැති වීම

2. බැඳීමෙහි වටිනාකම විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ නොහැකි වීම


3. ආයතනයේ සම්පූර්ණ පාලනයෙන් තොර වීම

4. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම

අසම්භව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළ වගකීම ලෙස හඳුනා නොගනී. ඒවා මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම පමණක් ප්‍රමාණවත් වේ.

ClassWork.LK

**ප්‍රතිපාදන හා අසම්භව්‍ය වගකීම් පහත රූප සටහන අධ්‍යයනය කිරීමෙන් වඩාත් පහසුවෙන් තේරුම්ගත හැකි වේ.**



## අසම්භව්‍ය වත්කම් :

අසම්භව්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වත්කමක් ලෙස හඳුනා නොගැනේ. ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් අපේක්ෂා කරන්නේ නම් පමණක් සටහනක් මගින් හෙළිදරව් කළ යුතු ය.

ClassWork.LK

<u>ප්‍රතිපාදන සඳහා උදාහරණ</u>

- විකුණු භාණ්ඩ මත වගකීම සහතික වීම මත වෙන් කිරීම (වෙළෙඳ ප්‍රතිලාභාර).
- කර්මාන්ත ශාලාවක් නිසා පරිසරයට සිදු වූ හානියක් සම්බන්ධයෙන් රජය හෝ වෙනත් ආයතනයක් මගින් නඩු පවරා ඇති විටක.
- සේවයෙන් පහ කරන ලද සේවකයකු වන්දි ඉල්ලා නඩු පවරා ඇති විටක, වන්දි ගෙවීම නිශ්චිතව හා විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කර ඇති විටක.

ClassWork.LK

## <u>අසම්භව්‍ය වගකීම් සඳහා උදාහරණ :</u>

- සේවයෙන් පහ කරන ලද සේවකයකු වන්දි ඉල්ලා නඩු පැවරීම. වන්දි ගෙවීම නිශ්චිත නොවීම හා විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කර නැති විටක.

- ආයතනයේ අංශයන් වසා දැමීම නිසා ගෙවිය යුතු වන්දි.

## <u>අසම්භව්‍ය වත්කම් සඳහා උදාහරණ :</u>

- ව්‍යාපාරයේ ඉඩමක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවරා ගැනීම වෙනුවෙන් ඉල්ලුම් කර ඇති වන්දි මුදල

ClassWork.LK

# හෙළිදරව් කිරීම්

| ප්‍රතිපාදන | අසම්භව්‍ය වගකීම් | අසම්භව්‍ය වත්කම් |
|---|---|---|
| කාලච්ඡේදයේ ආරම්භක හා අවසාන ධාරණ වටිනාකම්<br><br>කාලච්ඡේදය තුළ සිදු කරන ලද අතිරේක ප්‍රතිපාදන<br><br>කාලච්ඡේදය තුළ භාවිතයට ගත් ප්‍රතිපාදනය<br><br>භාවිත නොකර කාලපරිච්ඡේදය තුළ නැවත ලාභයට එකතු කළ ප්‍රතිපාදන (ප්‍රතිවර්ත්‍ය කිරීම්) | එහි මූල්‍ය බලපෑම පිළිබඳ ඇස්තමේන්තුවක්<br><br>සම්පත් ගලා යෑම්වල අගය හා කාලවකවානු පිළිබඳ අවිනිශ්චිතතා | අසම්භව්‍ය වත්කම් ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක්<br><br>ප්‍රායෝගිකව කළ හැකි නම් එහි මූල්‍ය බලපෑම පිළිබඳ ඇස්තමේන්තුවක් |

ClassWork.LK

## අභ්‍යාස - 01

i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 37 ට අනුව පහත පද නිර්වචනය කරන්න.

- ප්‍රතිපාදන
- අසම්භව්‍ය වගකීම්
- අසම්භව්‍ය වත්කම්

ii) ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් හා අසම්භව්‍ය වත්කම් වෙන් කර හඳුනා ගැනීමට ආදාළ කරුණු උදාහරණ මගින් පැහැදිලි කරන්න.

iii) ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් හා අසම්භව්‍ය වත්කම් හෙළිදරව් කිරීම සිදු කල යුතු ආකාරය දක්වන්න.

ClassWork.LK

## අභ්‍යාස - 02

පහත සඳහන් එක් එක් සිදුවීම සම්බන්ධයෙන් සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. ප්‍රතිපාදනයක් සේ සලකනු ලබයි නම් අදාළ ජර්නල් සටහන පෙන්වන්න.

i) සමාගමේ 2018/03/31 දිනෙන් අවසන් වර්ෂයේ වාර්ෂික විකුණුම් වටිනාකම රුපියල් මිලියන 2කි. මෙම වර්ෂයේ සිට වගකීම් සහතික මත භාණ්ඩ විකුණයි. මේ සඳහා වාර්ෂික විකුණුම් වටිනාකමින් 2%ක පමණ වේ යැයි විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකි ය.

ii) ව්‍යාපාරයෙන් ඉවත් කරන ලද සේවකයකු රු. 5 000 000ක වන්දි මුදලක් ඉල්ලා නඩුවක් පවරා ඇත. මෙම වන්දි මුදල ගෙවීමට සිදුනොවේ යැයි සමාගමේ නීතිඥ මහතා විශ්වාසදායි ව ප්‍රකාශ කර සිටී.

Class Work LK

iii) සමාගමෙන් රු. 200000 ක වන්දි මුදලක් ඉල්ලා පරිසර සංවිධානයක් විසින් නඩු පවරා ඇත. මෙම නඩුවේ තීන්දුව සමාගමට ගෙවීමට සිදු වෙතැයි සමාගමේ නීතිඥ මහතා විශ්වාසදායි ව ප්‍රකාශයක් කර සිටී.

iv) ගිවිසුම කඩ කළ ව්‍යාපාරිකයකුගෙන් රු. 400 000ක වන්දි ඉල්ලා සමාගම විසින් නඩුවක් පවරා ඇත. මෙහි තීන්දුව කෙබඳු වේද යන්න පිළිබඳ තව ම නිගමනයකට එළැඹ නැත.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura